සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**9 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
| --- |

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ප්‍රේමයේ පණත් පිළිපැදිය යුතු බව ක්‍රිස්තුන් වහන්සේ අපට උගන්වන ලද උපමා කථාව වනුයේ,
    (1) අබ ඇටයේ උපමාව (2) මිදි වැලේ උපමාව
    (3) වපුරන්නාගේ උපමාව (4) යහපත් සමරිතානුවරයාගේ උපමාව

02. එම්මාවුස් ගිය ගෝලයන් දෙදෙනා ක්‍රිස්තුන් වහන්සේ හඳුනාගත් අවස්ථාව වන්නේ,
    (1) එම්මාවුස් ගමනේ සිටියදී ය.
    (2) ගෝලයන් දෙදෙනා එදා රෑ සිටි ස්ථානයේදී ය.
    (3) රාත්‍රී ආහාර ගනිමින් පූප ගෙන ආශිර්වාද කරන විටදී ය.
    (4) ගෝලයන් දෙදෙනා අමුත්තා සමග කතා කරමින් යද්දීය.

03. ශුද්ධ වූ සභාවේ ලක්ෂණයක් නොවන්නේ,
    (1) අවංකත්වය (2) සාධාරණත්වය (3) ඒකත්වය (4) ශුද්ධත්වය

04. අභිවෘද්ධි ආලේපය ලබා ශුද්ධාත්මයාණ්ගෙන් පූර්ණව සිටින මාගේ වගකීම වන්නේ,
    (1) වරද කරන අයගෙන් ප්‍රවේශම් වන ලෙස අන් අයට උපදෙස් දීමය.
    (2) වරද කරන අය වෙනුවෙන් මැදිහත් වීමය.
    (3) වරද කරන අය මග හැර සිටීමය.
    (4) වරද දුටු තැන එඩිතරව එය පෙන්වා දීමය.

05. නූතන ලෝකයේ ජීවිත අභියෝග වලට අප මුහුණ දිය යුතු වන්නේ,
    (1) නොබියව (2) විශ්වාසයෙන් යුතුවය (3) ආලෝකමත්වය (4) ධෛර්ය සම්පන්නවය

06. ''ශුද්ධාත්මයාණන් ලබා ගැනීමෙන් ශුද්ධාත්ම ඵල ........... ක් ලැබේ.''
    මෙහි හිස්තැනට සුදුසු වන්නේ,
    (1) 12 (2) 06 (3) 10 (4) 07

07. ක්‍රිස්තුන් වහන්සේගේ .................... මරණය හා උත්ථානය, පාස්කු අභිරහස වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය වනුයේ,
    (1) ප්‍රාතිහාර්ය කිරීම (2) ඉපදීම
    (3) දුක්විඳීම (4) කුරුසියේ ඇණ ගැසීම.

08. ලාසරස්ව මළවුන්ගෙන් නැගිටුවීමේ ප්‍රාතිහාර්ය සිදු කළේ,
    (1) ජනතාව විශ්මිත කිරීමට. (2) මිතුරාව උත්ථානය කිරීමට.
    (3) ජනතා ඇදහිල්ල ස්ථිර කිරීමට. (4) සහෝදරයන්ගේ දුක නිවාලීමට.

09. දරුවන්ගේ මුල්ම ගුරුවරුන් වන්නේ,
    (1) පඬිවරුන් ය. (2) එඬේරුන්ය. (3) ගුරුවරුන්ය. (4) දිවැසිවරුන්ය.

10. චතාරික කාලය පටන්ගන්නේ,
    (1) අලු බදාදා . (2) මහ සිකුරාදා. (3) මහ බ්‍රහස්පතින්දා. (4) පාස්කු ඉරිදා

11. පුරාණ ගිවිසුමේ යාච්ඤාව පිළිබඳව විශිෂ්ඨතම කෘතිය වන්නේ,
    (1) නික්මයාම පොතයි. (2) ක්‍රියා පොතයි. (3) උත්පත්ති පොතයි. (4) ගීතාවලියයි.

12. ශ්‍රී ලංකාවේදී භාග්‍යවරයට ඔසවනු ලැබුයේ,
    (1) ගොන්සාල්වේස් පියතුමා (2) ජුසේවාස් පියතුමා
    (3) අසීසියේ ප්‍රැන්සිස්තුමා (4) ශුද්ධ වූ ජුසේතුමා

The National e-learning portal for the General Education

13. තෙරේසා මව්තුමිය තම දිවිය කැප කළ නිකාය කුමක් ද?
(1) මිෂනාරි ඔෆ් ද චැරිටි (2) ෆ්‍රැන්සිස්කන් නිකාය (3) ජපමාල නිකාය (4) ලොරෙට්ටෝ නිකාය

14. කිතුණු දූරියක / දරුවකු වන මම,
(1) ජීවිතය යාච්ඤාවක් කර ගනිමි. (2) දේව කැමැත්තට සංවේදීව ජීවත් වෙමි.
(3) දේව වචනයේ අභ්‍යාසය ලබමි. (4) දේව වචනයට අනුකූලව ජීවත් වෙමි.

15. මිනිස් කමට ගරු කිරීමට නම් ........................ අනුව ජීවත් විය යුතුය.
හිස්තැනට සුදුසු යෙදුම වන්නේ,
(1) දේව දීමනා වලට (2) දේව ප්‍රේමයට (3) හෘද සාක්ෂියට (4) දේව පනත්වලට

16. දෙවියන් වහන්සේගේ ආදරයේ සැලැස්ම අනාවරණය කළේ,
(1) ශු. සභාව තුළිනි. (2) අපගේ පවුල තුළිනි. (3) අන්තර්ජාලය තුළිනි. (4) මැවිල්ල තුළිනි.

17. පාස්කු අභිරහස යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගත වීමයි.
(2) ක්‍රිස්තුන් වහන්සේගේ සේවා කාලයයි.
(3) ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානයයි.
(4) ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයයි.

18. ශුද්ධ වූ බයිබලයේ සඳහන් ද්විතීය සම්මත ග්‍රන්ථ ගණන වන්නේ,
(1) 6 (2) 7 (3) 12 (4) 10

19. ගෝලයන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කළ දිනය වන්නේ,
(1) පාස්කු දිනය (2) නත්තල් දිනය (3) පෙන්තකොස්ත දිනය (4) මහ සිකුරාදා දිනය

20. සියදිවි හානිකර ගන්නා කිතුවා කරන්නේ,
(1) තම ජීවිත ගැටළු වලින් පලා යාමය.
(2) තම පවුලේ අයට කැළැලක් ඇති කිරීමය.
(3) දෙවිඳුන්ට හිමි සම්පතක් උදුරා ගැනීමය.
(4) ජීවිතයේ අගය අවතක්සේරුවට භාජනය කිරීමය.

The National e-learning Portal for The General Education

21. දෙවිඳුන්ට පඬුරු ඔප්පු කරනවාට වඩා වැදගත් වන්නේ,
(1) සහෝදරයා සමඟ සමගි වීමය. (2) දිළිඳුන්ට දන් දීමය.
(3) වන්දනා ගමනක් යාමය. (4) දිව්‍ය පූජාවට සහභාගී වීමය.

22. දේව වචනය තුළින් ඔබගේ ජීවිතය අර්ථවත් කර ගැනිමට ඔබ කළ යුත්තේ,
(1) නිතරම ශුද්ධ බයිබලය කියවීමය.
(2) දේව වචනය පිළිබඳ ගැඹුරින් භාවනා කිරීමය.
(3) පාසලේ උදේ යැදුමට දේව වචනය යොදා ගැනීමය.
(4) දේව වචනයේ පණිවිඩය ජීවිත අත්දැකීමක් කර ගැනීමය.

23. ශුද්ධාත්ම ඵල පමණක් සඳහන් වන පිළිතුර වන්නේ,
(1) ප්‍රේමය, කරුණාව, දානගැන්ම (2) සාමය, ප්‍රීතිය, මෘදුකම
(3) යහපත්කම, විශ්වාසවන්තකම, තේරුම් ගැනීම (4) ප්‍රඥාව, මෘදුකම, ආත්ම දමනය

24. අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කළේ,
(1) පෙන්තකොස්ත දිනයේදී (2) පාස්කු මංගල්‍ය දිනයේදී
(3) ස්වර්ගාරෝහණ දිනයේදී (4) ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍ය දිනයේදී

25. අප කරන වරදට සමාව ලැබෙන්නේ,
(1) අප මින් පසු වැරදි නොකරන තරමටය.
(2) අපගේ වැරදි ගැන මනස්ථාපනය වූ විටය.
(3) අපට වැරදි කරන අයට අප සමාව දෙන ආකාරයටය.
(4) දෙවියන් වහන්සේගෙන් සමාව ඉල්ලූ විටය.

26. ඉල්ලන්න. ඔබට දෙනු ලැබේ ........................................ මෙම වාක්‍ය සම්පූර්ණ වීමට සුදුසු වරණය වන්නේ,

(1) දොර අරිනු ලැබේ. (2) සොයන්න. ඔබට සම්බ වේ.

(3) විමසිලිමත් වන්නාට ලැබේ. (4) තට්ටුකරන්න. විවෘත වේ.

27. ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියා ගණන වන්නේ,

(1) 5 යි. (2) 6 යි. (3) 12 යි. (4) 7 යි.

28. අඩීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස්තුමාගේ යැදුමක් වූයේ,

(1) ''පියාණෙනි, මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත ඉටුවේවා'' යන්නය.

(2) ''මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදම් අනයි'' යන්නය.

(3) ''මගේ ස්වාමීන් මහත් දේ මට සිදු කළ සේක.'' යන්නය.

(4) ''ස්වාමීනි, මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව.'' යන්නය.

29. ඔවුහු ප්‍රෙරිතවරුන්ගේ ඉගැන්වීමෙහිද සහභාගිකමෙහිද රොටී කැඩීමෙහිද .............. ද නිතරම කල්ගත කළහ. ඉහත හිස්තැනට නිවැරදි පිළිතුර වන්නේ,

(1) යාච්ඤාවෙනි. (2) එකමුතුකමෙනි. (3) ශුද්ධවන්තකමෙනි. (4) සහෝදරත්වයෙනි.

30. ඔබට පැවිදි හෝ පූජක හෝ ජීවිතය සඳහා කැඳවීමක් ඇතැයි සිතන්නේ නම්, ඔබ කළ යුතු ප්‍රධානම කාර්යය වන්නේ,

(1) මීසම් භාර පූජා ප්‍රසාදි තුමා හමුවී ඒ බව පැවසීමයි.

(2) දෙමාපියන් සමඟ ඒ ගැන සාකච්ඡා කිරීමය.

(3) දේව කැමැත්ත තෝරා ගැනීම සඳහා යාච්ඤා කිරීමය.

(4) එම කැඳවීම හා සම්බන්ධ නිකායන් ගැන සොයා බැලීමය.

31. නූතන ලෝකය තුළ දේව අනාවරණය දන ගන්නේ,

(1) දේදුන්නක් තුළිනි. (2) ශු. බයිබලය හා දේව වචනය තුළිනි.

(3) ජල ගැලීම මගිනි. (4) නොදැවෙන පැඳුරක් තුළිනි.

32. තාපස නිකායට ඇතුළු වීමට අදහස් කරන්නකුට ඒ සඳහා,

(1) අධ්‍යාපන සුදුසුකමක් තිබිය යුතුය.

(2) සුදුසු සමාජ තත්ත්වයක් තිබිය යුතුය.

(3) දේව මහිමය සඳහා වැඩ කිරීමට හැකියාවක් තිබිය යුතුය.

(4) දේව කැඳවීමක් තිබිය යුතුය.

33. ජන වන්දනාව යනුවෙන් අදහස් කරන්නේ,

(1) දේව ජනතාව දෙවියන් වහන්සේට වන්දනා පුද කිරීමයි.

(2) දිව්‍ය පූජාව සිදු කිරීමයි.

(3) ප්‍රසාද ස්නාපනය ලබා ගැනීමයි.

(4) දෙවියන් වහන්සේගේ ආදරය ජනතාව වෙත ගලා ඒමයි.

34. ජන වන්දනාවේ හදවත ඉරුදිනයි. මේ සඳහා වඩාත්ම සුදුසු වන්නේ,

(1) ඊශ්‍රායෙල්වරු මිසර දේශයෙන් මිදී පොරොන්දු දේශයට යාමයි.

(2) දෙවියන් වහන්සේ ලෝකය මවා සත්වන දවසේ දී නිවාඩු ගැනීමයි.

(3) ඉරුදින ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ දවසයි.

(4) කිතුණු ජනතාව සංසයක් ලෙස දෙවිඳුන්ට තුති ප්‍රශංසා කිරීමයි.

35. ස්වර්ගීය භෝජනයට අප මෙලොව සම්බන්ධ වන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය මගිනි. (2) දිව්‍ය සත්ප්‍රසාදය මගිනි.

(3) ප්‍රසාද නිධාන ලැබීම තුළිනි. (4) ශු. සභාවේ සාමාජිකත්වය තුළිනි.

36. ඊශ්‍රායෙල් සෙනග ශුද්ධ වූ ජනතාවක්, කැප වූ ජාතියක් හා දේව ආදරය විශේෂයෙන් ලද පිරිසක් බවට පත්වූයේ,

(1) නෝවා සමග කළ ගිවිසුම මගිනි. (2) ආබ්‍රහම් සමග කළ ගිවිසුම මගිනි.
(3) දිවැසිවරුන්ගේ ප්‍රකාශන මගිනි. (4) සීනයි ගිවිසුම මගිනි.

37. ශුද්ධ වූ සභාවේ වර්තමාන නායකයා කවුද?

(1) 23 වැනි ජුවාම් පාප්තුමා (2) 2 වන ජුවාම් පාවුලු පාප්තුමා
(3) 1 වන ප්‍රැන්සිස් පාප්තුමා (4) 16 වෙනි බෙනඩික් පාප්තුමා

38. ''මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද, ගලවා ගන්නට ද වැඩිය සේක.'' ජේසුතුමා මෙම ප්‍රකාශය කළේ,

(1) ජයිරස්ගේ නිවසේදී (2) සීමොන් පර්සිවරයාගේ නිවසේදී
(3) සකෙවුස්ගේ නිවසේදී (4) පේදුරුගේ නැන්දනියගේ නිවසේදී

39. දේව අනාවරණයේ සුල මුල වන්නේ,

(1) විශ්වාසයයි (2) ප්‍රේමයයි (3) බලාපොරොත්තුවයි (4) දේවානුභාවයයි

40. සාම යැදුම කවුරුන්ගේ නිර්මාණයක් ද?

(1) ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා (2) ජුසේවාස් පියතුමා
(3) එස්.ජේ. පෙරේරා පියතුමා (4) අසීසියේ ප්‍රැන්සිස් තුමා

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) (1) ජනවන්දනාවේ ප්‍රධාන අංග තුනෙන් දෙකක් නම් කරන්න.
(2) ක්‍රිස්තියානි ජීවිතයේ උල්පත හා මුදුන් මල්කඩ කුමක් ද?
(3) පුරාණ ගිවිසුමේ හා නව ගිවිසුමේ යාගය වූයේ කවුරුන් ද?
(4) ක්‍රිස්තු ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණ 03 ක් ලියන්න.
(5) ශුද්ධාත්මයාණන් ලැබූ මුල්ම පිරිස කීයද?

(02) (1) ''දෙවියන් වහන්සේ සත්‍ය වන සේක.'' තම වචනය හා ක්‍රියාව තුළ දෙවියන් වහන්සේ සත්‍යවාදී වූ සේක. ඒ අනුව දෙවිපියා තම පොරොන්දු ඉටු කළ සේක. ඒ මොනවා ද?
(2) ඔබ සත්‍යයට සාක්ෂි දැරූ අවස්ථාවක් සඳහන් කරන්න.
(3) සත්‍යයට සාක්ෂි දැරීමේදී මුහුණ දෙන අභියෝග 04 ක් ලියන්න.

(03) (1) ප්‍රේමයේ ගුණාංග ලියා දක්වන්න.
(2) මිදිවැලේ උපමා කථාව ලියන්න.
(3) සමාජයේ සැබෑ ප්‍රේමය බලාපොරොත්තු වන අය කවරේ ද? මේ අයට ප්‍රේම කරන ආකාරය ලියන්න.

(04) (1) ජන වන්දනාව යනු කුමක් ද?
(2) මුල් කිතුණු සභාවේ ජන වන්දනාව තුළ තිබූ ලක්ෂණ මොනවා ද?
(3) එම්මාවුස් සිද්ධිය හා දිව්‍ය පූජාව අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(05) (1) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 02 නම් කරන්න.
(2) ඉරු දින දිව්‍ය පූජාවේ දේව වාක්‍ය පිළිවෙතට අර්ථවත්ව සහභාගී වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න.
(3) ''ඉරු දින දිව්‍ය පූජාවට අර්ථවත්ව සහභාගී වීම'' යන මැයෙන් වචන 50 ක පමණ රචනාවක් ලියන්න.

(06) පහත සඳහන් පුද්ගලයින් අතරින් දෙදෙනෙකුගැන කෙටි සටහන් ලියන්න.

(1) අති උතුම් ලියෝ නානායක්කාර රදගුරුතුමා (2) මයිකල් රැදිගු පියතුමා
(3) අති උතුම් බී. දියෝගු පිල්ලේ රදගුරුතුමා (4) මහත්මා ගාන්ධිතුමා